# නපුරු මාගුට් හොඳ වුණු හැටි



රිතූෂි මෙත්සාරා යකුපිටිආරච්චි

# නපුරු මාලුට් හොඳ වුණු හැටි

## රිතූෂි මෙත්සාරා යකුපිටිආරච්චි

කතෘ

## පළමු දිගහැරීම

පාසල - මහමායා බාලිකා විදුහල, මහනුවර

ඉගෙනුම ලබන පංතිය - 6 G

කෘතිය පළ කරන දිනය - 2026.05.10

# පිදුම

මාගේ පාසලේ ආදරණීය විදුහල්පතිතුමියටත්, අංශභාර සහකාර විදුහල්පතිතුමියටත්, මාගේ දයාබර ගුරුතුමියටත්, අනෙකුත් ගුරු මහත්ම මහත්මීන්ටත්, මා හැදූ වැඩූ දෙමාපියන්ටත්, යෙහෙළියන්ටත් මෙය පුදමි.

# පෙරවදන



දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදූ කරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොතේ ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණායි. මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතූන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදූහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැප වූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්, ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැප වූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථ කරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# පටුන


| | |
|---|---|
| 1 කොටස | 1 |
| 2 කොටස | 7 |

# 01 කොටස

ඔන්න එකමත් එක රටක පුංචි පවුලක මාග්‍රට් කියල පොඩි ළමයෙක් හිටියා. එයා හරිම ලස්සනයි. එයාට අක්කලා තුන්දෙනෙක් ඉන්නවා. එයාලා මාග්‍රට්ට ගොඩක් ආදරෙයි. ඒත් මාග්‍රට් චුට්ටක් නපුරු නිසා මාග්‍රට් අක්කලාට එච්චරම ආදරේ නැහැ. ඔන්න දවසක් එයාට ලස්සනම ලස්සන සෙල්ලම් බඩුවක් හම්බුනා. ඔන්න අක්කලා තුන්දෙනා ඒක දැක්කා.

”නංගී අපිට ඕක චුට්ටක් බලන්න දෙන්නකෝ ”

”අපෝ! මම මොකටද ඔයාලට දෙන්නේ? මේක මටනෙ හම්බුනේ”

ඒ වෙලාවේ අම්මා එතනට ආවා.
”ඇයි ළමයිනේ ඔයලා රණ්ඩු වෙන්නේ” කියල අම්මා අහුවා.

"අම්මේ අක්කලා මගේ සෙල්ලම් බඩුව ඉල්ලනවානේ" මාග්‍රට් කිව්වා.

" අම්මේ අපි චුට්ටක් බලන්න ඉල්ලුවේ" අක්කා කිව්වා. එතකොටම තාත්තා මෙතනට ආවා.

"මොකද මොකද මෙතන සද්දේ"

"නෑ තාත්තේ මොකුත් නෑ"
මාග්‍රට් තාත්තටනම් හොඳටම බය නිසා එහෙම කිව්වා. එයා තරම් තාත්තාට අක්කලාවත් බය නෑ. එයා බය එයා රණ්ඩු වෙද්දී තාත්තා එයට බනින නිසා.

ඔන්න අම්මා මුළු විස්තරේම තාත්තට කීවා. එතකොටම මාග්‍රට් අඬන්න පටන් ගත්තා. ඒත් එක්කම අක්කලා එයාට හිනා වෙන්න පටන් ගත්තා.
හා...... හා....... හා....... හා.......

මාග්‍රට් ඒ වෙලේම දුවගෙන කාමරයට ගියා.

කාමරයට ගිහින් එයා ගැන හිතුවා.

"අනේ බලන්නකෝ මටත් වෙච්ච දේ" කිය කියා අඩන්න පටන් ගත්තා.

ඊටපස්සේ එයා අඬ අඬා ඉන්නකොටම එයාට නින්ද ගියා.

ඔන්න අලුත් දවසක් පටන් ගත්තා. එයා උදේම නැගිටලා මූණ එහෙම සෝදගෙන අලුත් ඇඳුමක් දාගෙන එයගේ උදේ කෑම ගන්න කෑම මේසේ ළඟට ගිය. එත්කොට අක්කලත් ආවා.

"ආ නංගී සුභ උදෑසනක්" අක්කා කීවා.

ඒත් මාග්‍රට් "හරි හරි " විතරයි කිව්වේ.

ඊටපස්සෙ තාත්තයි, අම්මත් එතනට ආවා.

"සුභ උදෑසනක් ළමයි. " අම්මා කීවා.

අක්කලා සුභ උදෑසනක් කීවා ඒත් මාග්‍රට් කට නෙවෙයි ඇරියෙ.

"හරි ළමයි කෑම මේසෙ ඉඳගන්න."

"හරි අම්මේ" අක්කලා කීවා.

එතකොටම එක අක්කෙක් අම්මා ළඟ ඉඳගන්න ගියා. ඒත් මාග්‍රට් ඇවිල්ලා එයාව තල්ලු කරලා ඉදගත්තා. අක්කගේ කකුල වැදිලා එයා අඬන්න පටන් ගත්තා.

"මාග්‍රට් ඔයා අද කාමරයට ගිහින් කන්න ඕනෙ" අම්මා මෙහෙම කිව්වෙ මාග්‍රට් එක්ක තරහින්.

එතකොටම මාග්‍රට් අම්මට කීවා "මට අද කෑම ඕනෙ නෑ" ඒත් එක්කම එයා කාමරයට යන්න යනකොට තාත්තා කීවා "ඔහොම නවතින්න මාග්‍රට්, ඔයා එහෙම කන්න නැතුව යන්න බෑ. ඔයාට ඉස්කෝලේ වැඩත් තියනවා නේද? ඔයා කාලා ඉවරවෙලා පාඩම් කරන්න ඕනෙ මුළු දවසම සෙල්ලම් කරන්න බැහැ" කියලා කීවා. මාග්‍රට්ට තාත්තා ඒක සැරෙන් වගේ කීවේ.

ඒ නිසා මාග්‍රට් හොඳටම බය වෙලා සද්ද නැතුව කෑම එක අරගෙන එයාගේ කාමරේට යන්න ගියා. ඔන්න අක්කලා කාමරය ළඟින් යන්න ගියා. ඊට පස්සෙ අක්කලා කීවා එන්න අපි සෙල්ලම් කරමු කියලා. මාග්‍රට් මෙහෙම කිව්වා

"අපොයි! මට බෑ ඔයාලත් එක්ක සෙල්ලම් කරන්න" තරහින් වගේ කීවා.

”අප්පෝ අපි නිකම් ඇහුවෙ අක්කෙක් කීවා.” තාත්තා එතනට ආවා.

”ඇයි ඇයි මේ ඔයාට පාඩම් කරන්න නේද මම කීවේ. අක්කලා යන්න සෙල්ලම් කරන්න.” හරි තාත්තේ අක්කලා කීවා.

මාග්‍රට් මෙහෙම කීවා තරහින් වගේ

”එයාලට විතරයිනෙ යන්න දෙන්නේ” තාත්තා ඒ කිසි දෙයක් ඇහෙන්නෙ නැතිව ආපසු හැරිලා ගියා. ඊට පස්සෙ තාත්තා ආපසු ආවා.

ඒත් මාග්‍රට් නම් පාඩම් කර කර හිටියේ නැහැ තාත්තා හිමින් හිමින් කාමරයට ඇතුළු වුනා. මාග්‍රට් අම්මාගේ පෝන් එක අරගෙන් පොත ඇතුළට දාගෙන බලනවා තාත්තා දැක්කා ”මාග්‍රට් මම ඔයාට කියලා ගියේ පාඩම් කරන්න කියලා නේ කිව්වේ.” තාත්තා සැරෙන් කිව්වා. මාග්‍රට් ගැස්සිලා ගියා. එතනින් අම්මත් ආවා. අම්මා තාත්තගෙන් අහුවා ඇයි දුවට බනින්නෙ කියලා. ඒ වෙලාවෙ අම්මත් පෝන් එක හොය හොයා ඇවිත් තියෙන්නෙ. තාත්තා අම්මට විස්තරේ කිව්වා. අම්මයි තාත්තයි දෙන්නම මාග්‍රට්ට බැන්නා. අක්කලත් එතනට

ආවා. අක්කලා ඇයි කියල ඇහුවා. අම්මා අක්කලට විස්තරේ කීවා. අක්කලත් නංගිට කිව්වා එහෙම කරන්න එපා කියලා. ඔන්න දැන් කලුවර වැටීගෙන එනවා ඔන්න දැන් මාග්‍රට් වත්තේ හාවෙක් කෑ ගහනවා සද්දයක් ඇහෙනවා. මාග්‍රට් එළියට ගිහින් බලනවා. ඈත හාවෙක් තුවාල වෙලා ඉන්නවා මාග්‍රට් දැක්කා. මාග්‍රට් අම්මට කතා කරා. ඊට පස්සෙ අම්මයි, මාග්‍රටුයි හාවව ඇතුලට ගෙන තුවාල වලට බෙහෙත් දැම්මා. මාග්‍රට් අම්මගෙනුයි තාත්තගෙනුයි අහුවා "අපි හාවව හැමදාම ගෙදර තියා ගමුද" කියලා.

තාත්තයි අම්මයි දෙන්නම මාග්‍රට්ගේ යෝජනාවට කැමති වුණා. අක්කලාත් හාවව අල්ලන්න ගියා. මාග්‍රට් හාවව අරගෙන කාමරයට ගිහින් දොර වහ ගත්තා.

# 02 කොටස

ඔන්න මාග්‍රට් උදේම නැගිටලා මූණ සෝදගෙන කෑම මේසෙ ළඟට ආවා. එතනට අම්මයි තාත්තයි අක්කලත් ආවා. පලවෙනියට මාග්‍රට් තමයි සුබ උදෑසනක් කීවේ. අක්කලා පුදුම වුණා. සුබ උදෑසනක් දුව අම්මා කිව්වා. අම්මේ නංගී වෙනස් වෙලා නේද අක්කා අම්මට කිව්වා. ඔව් පුතේ කියල අම්ම කිව්වා. දැන් හැමෝම කමුකො. හා අම්මේ. ඔන්න හැමෝම ඉදගෙන්න කිව්වා. මාග්‍රට් ගිහිල්ලා ඉඳගත්තා "අම්මේ අද මොනවද කන්න තියෙන්නේ"

"පුතේ බත් තියෙන්නේ" අම්මා කීවා. "හරි අම්මේ" මාග්‍රට් කීවා. තාත්තා අම්මට මෙහෙම කිව්වා " මට හිතා ගන්න බෑ මෙච්චර හොඳ වුනා කියලා" අම්මා මෙහෙම කිව්වා "අනේ මන්දා මටත් හිතා ගන්න බෑ" කිව්වා.

"මට හිතන විදියට අර තුවාල වුණ හාවා නිසාද කොහෙද මාග්‍රට් වෙනස් වුනේ" අම්මා කිව්වේ හරිම සතුටින්.

"ඒක තමයි" "ඔව් ඔව්" තාත්තා කිව්වේ එහෙම.

ඔන්න මාග්‍රට් අක්කලාත් එක්ක හාවා අල්ල අල්ල ඉන්නවා. එතනට අම්මා ඇවිල්ලා කිව්වා ළමයි පාඩම් කරන්න කියලා. මාග්‍රට් එතකොට අම්මාට හරි අම්මේ කියලා ගියාලු. අම්මාට ලොකු සතුටක් දැනුනලු.
ඔන්න ටික දවසක් ගියා මාග්‍රට්ගේ උපන් දිනයත් ආවා. එයා උදෑසනම නැගිටලා හාවත් එක්ක එලියට ගියා. අනේ හාවගේ අම්මා ඇවිත් බලාගෙන ඉන්නවා. මාග්‍රට් හාවව අත ඇරියා එයාගේ අම්මා හාඅම්මා ළඟට. හා පැංචී හා අම්මා ළඟට දුවගෙන දුවගෙන ගියා. මාග්‍රට් එයාගේ උපන් දිනය දවසේ හොඳ වැඩක් කරා. මාග්‍රට් ගේ ඇතුලට එනකොට අම්මා හා පැටියා කෝ කියලා ඇහුවා. මාග්‍රට් අම්මාට විස්තරය කිව්වා. ඔන්න රෑ වුනා. එයාගේ යාලුවෝ ගෙදර ඇවිල්ලා. ඔන්න අම්මා රසම රස කේක් හදලා අනේ මාග්‍රට්ට හරිම සතුටින්.
ඔන්න දවසක් ලස්සන ගෑණු ළමයෙක් මාග්‍රට්ලගේ වත්තට ඇවිල්ලා හිටියා. මාග්‍රට් එලියට ගියා ඉටපස්සේ ඒ ලස්සන ළමයා එක්ක කතා කරා ඒ දෙන්න දැන් හොඳ යාලුවෝ. මාග්‍රට් ඒ වුනත් එයා ඒ යාලුවා එක්ක සෙල්ලම් කරන්න ගියේ නෑ. ඒක අම්මා දැක්කා.

”ඇයි දුව අම්මා එක්ක සෙල්ලම් කරන්න ගියෙ නැත්තේ” අම්මා අහුවා.

”මට හෙට විභාගෙ අම්මේ එකයි සෙල්ලම් කරන්න ගියෙ නැත්තේ.”

අම්ම මාග්‍රට්ගෙන් මෙහෙම ඇහුවා ”එහෙනම් මොනවද කතා කර කර හිටියේ”

”එයත් මගේ පන්තියේ අම්මේ.” මාග්‍රට් කීවා.

”හරි හරි” අම්මා කීවා.

ඔන්න එතකොට තාත්තා එතනට ආවා. ”ඇයි ඇයි මොකද මෙතන වෙන්නේ” කියලා තාත්තා ඇහුවා.

”තාත්තේ මට හෙට වාර විභාගේ” මාග්‍රට් කීවා.

එතකොටම අම්ම උයන්න තියනවා කියලා නැගිටලා ගියා.

දුව ඔයා පාඩම් කරාද? තාත්තා ඇහුවා. ”ඔව් තාත්තේ” මාග්‍රට් උත්තර දුන්නා.

ඔන්න මාග්‍රට් කෑම කාලා කාමරයට ගිහින් නිදිය ගත්තා. ඊට පස්සේ එතනම එයාට නින්ද ගියා.

ඔන්න ලස්සන දවසක් උදා වුනා. මාග්‍රට් ඉස්කෝලේ යන්න ලෑස්ති වුණා. අක්කලාත් ලෑස්ති වුණා. ඔතන අම්මා උදේම නැගිටලා කෑම අදාල කෑම පෙට්ටි වලට බෙදුවා. "ළමයි, එන්න කෑම පෙට්ටි ගන්න" අම්මා කිව්වා, "හරි අම්මේ එනවා......." මාග්‍රට් කීවා.

ඔන්න අක්කලායි මාග්‍රටුයි තාත්තයි, අම්මාටයි වැඳලා බුදු හාමුදුරුවන්ටත් වැන්දා.
"ළමයි එන්න කාර් එකට නගින්න" තාත්තා කිව්වා.
"හරි තාත්තේ" මාග්‍රට් කිව්වා. ඔන්න එයාලා ඉස්කොලේ ළඟට ගියා.

ළමයි බහින්න. "හරි......" හැමෝම කිව්වා.
ඔන්න ඊටපස්සේ මාග්‍රට් ඉස්කෝලේ ඇතුලට ගියා.
ඔන්න එයා ඇතුළට ගිහින් විභාගේ ලියලා ගෙදර ආවා.
මාග්‍රට් ගෙදර ආපු ගමන් තාත්තා මෙහෙම ඇහුවා. "දුව විභාගෙ ලේසිද? "

"ඔව් තාත්තේ" මාග්‍රට් කීවා.

"හොඳයි එහෙනම් ඔයා විභාගෙට වැඩියෙන් ලකුණු ගත්තොත් ඔයාට මම ලස්සන තෑග්ගක් අරන් දෙනවා" තාත්තා කිව්වේ හරිම සතුටින්.

"හරි තාත්තේ" මාග්‍රට් කීවා.

ඔන්න ටික දවසකින් මාග්‍රට්ගේ විභාගේ ලකුණු ආවා. මාග්‍රට් ඉස්කෝලේ ගිහිල්ලා ගෙදර ආවා

"තාත්තේ……… තාත්තේ…… මම විභාගේ ගොඩක් ලකුණු ගත්තා." ඔන්න මාග්‍රට් ගෙදර ආපු ගමන් සතුටින් කීවා.

තාත්තා මෙහෙම කිව්වා "දුව මෙන්න ඔයාගෙ තෑග්ග"

"මොකක්ද තාත්තේ මේකෙ ඇතුලෙ තියෙන්නෙ" මාග්‍රට් ඇහුවා. එතන අම්මයි අක්කයි ආවා. එයාලත් එතනට දුවගෙන ආවෙ තෑග්ග බලන්න. "මාග්‍රට් ඕක කඩන්න බලන්න" හැමෝම ආසාවෙන් බලාගෙන ඉද්දී අම්මා කීවා.

එතකොටම මාග්‍රට් තෑග්ග කඩලා බැලුවා. මාග්‍රට් පුදුම වුනා තෑග්ග දැකලා. මාග්‍රට් තාත්තගෙන් කලින් ඉල්ලලා තිබුණ බෝනික්කෙක්. ඉතිං ඒ ලස්සනම ලස්සනම බෝනික්කා තමයි තාත්තා මාග්‍රට්ට අරගෙන දුන්න තෑග්ග.

මාග්‍රට් තාත්තට මෙහෙම කීවා. ”ඔයාලා තමයි මට ඉන්න මේ ලෝකේ හොඳම පවුල”
ඔන්න ඊටපස්සේ එයාලා සතුටින් ජීවත් වුනා.

# නිමි

# ස්තූතියි